

# අධිමාස පකාසනී

# අධිමාස පකාසනී.

කොළඹ පරණ කොලොන්නාවේ

වෙලුවනාරාමාධිපති

ශ්‍රීපවර යසපණ්ඩිත සද්ධම්මවංසපාල ගණාචරිය

ධම්මතිලක මහානායක ස්ථවිර පාදයන්

වහන්සේ විසින්

සම්පාදිතයි.

---

ඇඩ්වින් නාඹෙව්, ගජකරුණා

මහතා විසින්

අම්බලම්ගොඩ

විජය යන්ත්‍රාලයෙහි අච්චුගස්වා ප්‍රසිද්ධ කරණලදී.

---

25-11-1921.

# නමො බුද්ධාය.

1 අග්ගං ලොකස්ස සම්බුද්ධං  අග්ගං ධම්මං සිවං දදං,
අග්ගං අරිය සඞ්ඝංච  නත්වාන ගෙගනගාමුද.

2 විසුද්ධ මතගාගිනං  සංයමිනං හිතාසිනං,
අධිමානාති සම්පන්න  වංසානි පරිදීපයෙ.

3 අස්මිං පමාදලෙඛාති  පදුති අක්ඛරාකිච්චං,
අගණෙත්වා යථා අත්ථං  ගණ්හන්තු විචක්ඛණා.

4 පන සප්පලගාමම්හි  ජාතසංසුද්ධ වංසිකො,
සිරිදිජය බොධිරාජා  රම්මාධිපති පුඤ්ඤවා.

5 ධම්මජොති සමඤ්ඤතො  ථෙරො සාසනමාමකො,
ගන්ත්වා තම්බුම්මවිසයං  සාසනුජ්ජොතකාරිනං.

6 ඤාණාභිවංස ධම්මාධි  සෙනාපති සමඤ්ඤිතං,
සඞ්ඝරාජ මහාථෙර  පමුඛානං තපස්සිනං.

7 සන්තිකෙ උපසම්පජ්ජි  චිරකාලං වසං තහිං,
නිස්සයම්පි සමාදාය  සඞ්ඝරාජස්ස සන්තිකෙ.

8 පඤ්චවස්සාධිකං කාලං  සධම්මං උග්ගහෙත්වපි,
තෙහිදින්නමනෙකානි  පොත්ථකානිචධාතුයො.

9 තහිං මහානරින්දෙන  කතවෙදවිනිච්ඡයං,
පරිවත්තාපයිත්වාන  භාසංමාගධිකංපුන,

10 ගහෙත්වාන සකාරාමං  පත්වා ආගම්ම ඹුම්බතො,
වසන්තො මුම්මවංසංසො  ජොසාභාසි ඉධ සීහලෙ.

11 පන්නාපන්නාධිමාසෙව  තස්මිං වෙදවිනිච්ඡයෙ,
දිස්සන්තෙවත්ථතො අඤ්ඤං  යාචාධිමාස දීපනං.

12 ජායාමූලත්තම්පි භාවත්ථ  වසෙනාපි නදිස්සති,
විවාදපන්නකානිච්චං  පලාපානි වදන්තිච.

13 අධිමාසාති සම්පන්න  වස්සානිසුවිජානිය,
වස්සූපනායිකාවත්තං  පුරෙතුං විනයානුගං.

14 ථාපුනපපාය භික්ඛූනං  චිරකාලප්ප හොනකං,
ගණිතඤ්ඤුං පසිද්ධං සො  ගවෙසිත්වාධිමාසකෙ.

15 සතවස්සාධිකංතිංස වස්සකාලප්පමාණකං,
අධිකාතිගණා පෙත්වා ගණෙතබ්බාතලිබාදිසු.

16 වස්සුක්කඨ්ඨකං ථෙරෙ තිස්සංකොච අනාගතෙ,
පොත්ථකං තං සකාරාමෙ වතාතෙවතසංසයං.

17 විනයාලඞ්කාරටීකා වරියොවාදදීපනෙ,
පරවාදෙපනාසෙතුං දස්සිතානි තහිං තහිං.

18 වදන්තිච්චාදි සඞ්ඛ්‍යාති ක්‍රියාපදානි චෙවතෙ,
අඤ්ඤාකාරක භාවම්පි නජානන්තිපමූල්හකා.

19 විනයාලඞ්කාර නාම ගණෙනවාද වීතිවජ්ජයෙ,
පඨමං දස්සිතං යාවාධිමාසං නථතොපන.

20 ගුණෙගත්වාන්විරුණ්ඩත්වා මණ්ඩලානි කරිත්වපි,
පුණ්ණම් තෙරසී යුත්ත වස්සුපි අසඞ්ඛිතා.

21 හරිත්වා අධිකංමාව ඡන්නෙයෙපි අච්චාරිය,
උපෙනති වස්සං පඨමං අසංගිරා අසඞ්ඛිතා.

22 කයිනත්වාර කම්මානි අවෙතතාව කරොන්තිව,
කරොන්ති සඞ්ඝකම්මානි කම්මාකම්මං අජානිය.

23 තෙසං උභයලොකත්ථ සිද්ධිංකාතුං මහීතලෙ,
කොසම්බජොති විඤ්ඤූතුං නජෙවාති විජානථානි.

ශ්‍රීමත් භුවනත්‍රය වාසීන්ට අග්‍රප්‍රාප්තවූ චතුරාර්‍ය්‍යසත්‍ය්‍ය වබොධයකල සර්‍වඥයන්වහන්සේද නිර්‍වාන ඵලය දෙන්නාවූ අග්‍රනවලොකොත්තර ශ්‍රී සද්ධර්‍මයද අග්‍රවූ අෂ්ටාර්‍ය්‍ය පුද්ගල මහා සඞ්ඝයා වහන්සේද මම දශනඛසමොධාන ශිර්‍ෂ කරණකොට ගෞණ සතුටින් නමස්කාරකොට විවාදම්නගෘහිතවූ භික්ෂූන්වහන් සේලාට හිතපිණිස අමනනාවධී මාස පැමිණෙන වර්‍ෂයන් පිරිසිඳ දක්විනුයෙම් මෙහි ප්‍රමාදයෙන් වැටුනාවූ පදඅක්ෂර ආදිය ගණන කට නොගෙණ අර්‍ථ යම්සේද එසේ පණ්ඩිතයෝ සලකත්වා පසු ගියශතවර්‍ෂකාලයෙහි කොස්ගොඩ නම්ග්‍රාමයෙහි උපන්නාවූ උභය කුල පරිසුඬ වංශ ඇති සිරිවිජයබොධිරාජාරාමාධිපතිවූ පුණ්‍යවන් ධම්මජොති නාමයෙන් ප්‍රසිඬවූ සථිරයන්වහන්සේ බුඬාදී රත් නත්‍රයෙහි මමත්වයඇතිව බුරුමරටට පැමිණ සර්‍වඥ ශාසනය බැබ ළවීම කරන්නාවූ ඤාණාභිවංසධම්මසෙනාපති යන නම් ඇති සඞ්ඝරාජ මහාසථිරයන්වහන්සේ ප්‍රමුඛකොට බුරුම සංඝයා වහන්සේලාගේ සමීපයෙහි උපසම්පදාවට පැමිණ

ඒ අමරපුරයෙහි කලක් වාසයකරණුයේ එම සඞ්ඝරාජ ස්වාමීන්
වහන්සේගේ සමීපයෙහි නිස්සාමාදන් වී මෙන් වර්ෂ පසකට
වැඩි කාලයක් ධර්මවිනය උද්ග්‍රහණයකොට නැවත ඒ සඞ්ඝරාජ
ස්ථවිරාදීන් විසින් දෙනලද ත්‍රිපිටක ධර්මයෙහි නොයෙක් පොත්ද
සර්වඥධාතු අරහන්තධාතුද ලැබ එරට මහරජතුමාවිසින් සියඛසින්
කරණලද වෙදවිකිවජය නම් අධිමාස ප්‍රකාශක පොත පාලි
භාෂාවට නැවත පෙරලවාගෙණ ඒ බුරුමරටෙන් අවුත් තමන්
වහන්සේ පෙර විසූ සිරිවිජයබොධිරාජාරාමයට පැමිණ වැඩවා
සයකරණුයේ මෙම ශ්‍රී ලඞ්කාවිපයෙහි ඒ මහාස්ථවිරයන්වහන්සේ
බුරුම සාසනවංසය පහළබැවුයේය. උන්වහන්සේ පාලිභාෂාවට
පෙරලවාගෙණ ආවාවූ ඒ වෙදවිකිවජයෙහි ප්‍රාප්තාධිමාස අප්‍රාප්
තාධිමාසනම දක්නාලැබේමය. එහිත් අභිනවූ මිථ්‍යාධිමාස
දක්වූවාවූ ජාසාමාත්‍රසඞ්ඛ්‍යාභාවයි වසයෙන්වත් නොපෙණේ.
යාවාධිමාස ප්‍රතිග්‍රහණයකොට විවාදකිරීමට පැමිණියෝ ඒ සම්
බන්ධව නිරතුරු ප්‍රලාපබස්ද දොඩවත්. අධිමාස පැමිණි වර්ෂයන්
මහාකොට දූත විනයානුකූලව උපසම්පන්නාසියාවත පුරන්ට
භික්ෂූන්වහන්සේලාව පහසුපිණිස බොහෝ කලකට පොහොනා
යේ එම මහාස්ථවිරතෙමේ ප්‍රසිද්ධවූ දෙනන්පිටියේ සිරිජයලත්
ජොතිරත්න සිගාරක්කාර විද්‍යාණේ ලොකාගෙණ ඔහු ලවා වර්ෂ
130 එකසියතිසකට ප්‍රමාණ අධිමාස වර්ෂ ගැණීම කරවා ලියවා
ගෙණ ඒ මහාස්ථවිරයන්වහන්සේ නිසැකව අධිමාස පැමිණි
වර්ෂයන්හි අධික හැර එකල්හි වස් විසූවේය ඒ අධිමාස පොත
උන්වහන්සේ විසූ ආරාමයෙහි මේදක්වාතිබෙනුය, සැකනොකට
යුතුයි. විනයාලඞ්කාරටීකාව කළ ආචාර්යයන්වහන්සේ එකල
එරට පැවති අධිමාස වාදයන් දක්වීමෙහි ඒ මිථ්‍යාවාද මත
ප්‍රකාශකරන්ට ඒ ඒ වාද මතයන්හි දක්වූවාවූ ක්‍රියාපදයන් අනා
ගත ක්‍රියාපද බැව්ද සිහිමුලාවූ ඒ මේ විවාදකාරයෝ නොද
නිත්. විනයාලඞ්කාර නම් පොතෙහි වාදවිනිච්ඡයේ මූලට දක්වන
ලද යාවාධිමාස වාද මතය බුද්ධවචනයක්සේ දූෂිතකොටගෙණ මෙරට
ගත කලියුගපාදයෙන් මණ්ඩලකොටවරදවාගැණගෙණ අමානතා
වයි:ස තෙළෙස යෙදෙන වර්ෂවලත් දෙසනානුකූලනොවන පෞ
ණිමාන්තාවති මාසවලක් කිසි සැකයක් නොකොට අධික හැර
විමසීමක් නැතිව තිබිය පසළොස්වකටද සැකනැතිව පැකිලී
මක් නැත්තෝ පෙරවස් එළඹෙත්. එසේ පෙරවස්වසා අසෙත්‍රවූ
ඉල්මසෙහිද කඨිනගෙණ අතුරත් එසේම සාමග්‍රීධර්මයට නියම
කල උපෝසථාදී සඞ්ඝකර්මද කම් අකම් දෙක නොදැන කරත්.
ඔවුන්ට දෙලොවට වැඩදායක අවබොධයක් කරන්ට මේ පැවුම්කල

යෙහි කවරෙක් සම්පිඬුයි පිරිසිඳ දැනගන්ට නැතිමානයි දැක්වීම යනු මේ ගාථාවන්හි අභිප්‍රායයි.

ඤාණාභිවංස ධම්මසේනාපති මහාධම්මරාජාධි රාජගුරු සඟරදතුමා විනයාලඞ්කාරය කළ තිපෙටකාලඞ්කාර මහාස්ථවිර පරම්පරාවෙන් පැවතෑ කෙනෙකි. උන්වහන්සේට සඟරද තනතුර දුන් ජද්දන්ත නාගරාජ සාමි මහාධම්මරාජ නම් බුරුම මහ රජතුමා රාජ්‍යශ්‍රී පදප්‍රාප්තවූ වර්ෂය පටන් විසිපස්වෙනි වර්ෂයෙහිදී ඒ රජතුමා බුරුම භාෂාවෙන් සාදා තිබුනු වෙදවිනිච්ඡය නම් පොත පාළිභාෂාවට පෙරළවා; "බෝගහපිටියේ" ධම්මජෝති මහාස්ථවිරයන්වහන්සේට දුන්බවත් පොත අවසානයෙහි පාෂාණච්ඡත්‍රයක්මෙන් දරවියයිද කියා ලියා තිබේ

ජද්දන්තනාගරාජසාමිමහාධම්මරාජස්ස ජයවස්සතො පඤ්චවීසතිමෙවස්සෙ ඡත්තිංසති අට්ඨසත දසාධිමාස සුඛදිනෙ, සාවනමාස කාළපක්ඛ සත්තමියං සීහලදීපතො ආගතස්ස පණ්ඩුල මණ්ඩලික භික්ඛුස්ස බොධිතරුපිට්ඨි නාමස්ස ධම්මජොතිස්ස ඤාණාභිවංස ධම්මසෙනාපති ථෙරෙණනීයාදිනා මහාධම්මරාජ වෙදවිනිච්ඡය කථාපරිනිට්ඨිතා යනුවෙන් දක්වාතිබේ

මෙසින් වටහාගතයුතුකරුණු නම් විනයාලඞ්කාරයෙහිපෙණෙන යාවාධිමාස පිළිවල සඟරදතුමා විනයානුකූල පණතක්ලෙසට පිළිනොගෙණතිබෙනබවත් සඟරදතුමා යාවාධිමාස සවල්ප මාත්‍රයකිනුදු සටහන් නොකිරීමත් සැලකියයුතුවා පමණක්නොව දසාධිමාස සුඛදිනයයි දැක්වීමෙන් අපි පච්ච්වාගණණත මණ්ඩල ක්‍රමයත් එකක්ම බව සඬකාවිරහිතව වටහාගතහැකිවේ. ධම්මජොති මහාස්ථවිරයන්වහන්සේ සිය රටට පැමිණියායින්පසු සමහර ගණිතඥයෙක් ලවා අධිමාස පතනය වන වර්ෂමාසාදිය ගන්නවා සටහන්කොට ලියවා තබාගණ උස්විසුබැව් මෙහි දක්වනලද අධිමාස මණ්ඩල ක්‍රමවලින් පැහැදිලිවඔප්පුවේ. අ විසින් පළමු අච්චුනස්වා ප්‍රසිධකළාවූ "අධිමාසලක්ෂණය" නම් පොතේ මණ්ඩලවලට සමානව අධිමාස පතනය වන ශකවර්ෂ මාසාදිය එම මණ්ඩල ක්‍රමයටම බුරුම බණ්ඩ කලියුගවර්ෂයත් වී. පච්චට්ඨාදි අධිමාස සතත් යෙදූබව්ද දතයුතුයි:

කොධාභිභූත මනසායතනෙසො ඉමස්මිං
සාධාරණම්හි විනයානු'මතෙ විරුද්ධා
යාවාධිමාස කුමතිං පරිගය්හ මොහා
පප්පොන්ති නෙකවිධ දුක්ඛමහං අපායං.

# ශ්‍රී ශුභ ශාලිවාහන ශක වර්ෂ 1754 පටන් අධිමාස පතනය වන මණ්ඩල චක්‍රයයි.

| මණ්ඩල | බ්‍රුම | ශක වර්ෂ | සූර්යමාස භාග | | කලා | විකලා | මණ්ඩල | බ්‍රුම | ශක වර්ෂ | සූර්යමාස භාග | | කලා | විකලා |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දස | 1168 | 1728 | කන්‍යා | 8 | 10 | 53 | දස | 1244 | 1804 | සිංහ | 2 | 2 | 36 |
| තෙ | 1171 | 1731 | වෘශභ | 24 | 16 | 48 | තෙ | 1247 | 1807 | මේෂ | 24 | 6 | 29 |
| | | 1733 | කුම්භ | 10 | 20 | 13 | | | 1809 | මකර | 10 | 10 | 24 |
| සෝ | 1174 | 1734 | | | | | සෝ | 1250 | 1810 | | | | |
| අවස් | 1176 | 1736 | තුලා | 26 | 24 | 38 | අවස් | 1252 | 1812 | කන්‍යා | 26 | 24 | 19 |
| වි | 1179 | 1739 | කටක | 12 | 28 | 33 | වි | 1255 | 1815 | මිථුන | 12 | 18 | 14 |
| | | 1741 | මීන | 28 | 32 | 28 | | | 1817 | කුම්භ | 28 | 22 | 9 |
| පව | 1182 | 1742 | | | | | පව | 1258 | 1818 | | | | |
| | | 1744 | ධනු | 14 | 36 | 21 | | | 1820 | වෘශ්චි | 26 | 16 | 4 |
| අවස් | 1185 | 1745 | | | | | අවස් | 1261 | 1821 | | | | |
| දස | 1187 | 1747 | කන්‍යා | 00 | 40 | 19 | දස | 1263 | 1823 | සිංහ | 00 | 29 | 59 |
| තෙ | 1190 | 1750 | වෘශභ | 16 | 44 | 14 | තෙ | 1266 | 1826 | මේෂ | 6 | 33 | 54 |
| | | 1752 | කුම්භ | 2 | 8 | 9 | | | 1828 | මකර | 7 | 37 | 53 |
| සෝ | 1193 | 1753 | | | | | සෝ | 1269 | 1829 | | | | |
| අවස් | 1195 | 1755 | තුලා | 18 | 52 | 4 | අවස් | 1271 | 1831 | කන්‍යා | 18 | 41 | 48 |
| වි | 1198 | 1758 | කටක | 4 | 55 | 56 | වි | 1274 | 1834 | මිථුන | 4 | 45 | 43 |
| | | 1760 | මීන | 20 | 59 | 54 | | | 1836 | කුම්භ | 20 | 49 | 38 |
| පව | 1201 | 1761 | | | | | පව | 1277 | 1837 | | | | |
| | | 1763 | ධනු | 7 | 3 | 49 | | | 1839 | වෘශ්චි | 6 | 53 | 33 |
| අවස් | 1204 | 1764 | | | | | අවස් | 1280 | 1840 | | | | |
| දස | 1206 | 1766 | සිංහ | 23 | 7 | 44 | දස | 1282 | 1842 | කටක | 22 | 58 | 28 |
| තෙ | 1209 | 1769 | වෘශභ | 9 | 11 | 29 | තෙ | 1285 | 1845 | මේෂ | 9 | 1 | 23 |
| | | 1771 | මකර | 25 | 15 | 34 | | | 1847 | ධනු | 25 | 5 | 18 |
| සෝ | 1212 | 1772 | | | | | සෝ | 1288 | 1848 | | | | |
| අවස් | 1214 | 1774 | තුලා | 11 | 19 | 29 | අවස් | 1290 | 1850 | කන්‍යා | 11 | 9 | 13 |
| වි | 1217 | 1777 | මිථුන | 27 | 23 | 24 | වි | 1293 | 1853 | වෘශභ | 27 | 13 | 8 |
| | | 1779 | මීන | 13 | 27 | 19 | | | 1855 | කුම්භ | 13 | 17 | 3 |
| පව | 1220 | 1780 | | | | | පව | 1296 | 1856 | | | | |
| | | 1782 | වෘශ්චි | 29 | 31 | 14 | | | 1858 | තුලා | 29 | 20 | 58 |
| අවස් | 1223 | 1783 | | | | | අවස් | 1299 | 1859 | | | | |
| දස | 1225 | 1785 | සිංහ | 15 | 39 | 9 | දස | 1301 | 1861 | කටක | 15 | 24 | 53 |
| තෙ | 1228 | 1788 | වෘශභ | 1 | 39 | 4 | තෙ | 1302 | 1864 | මේෂ | 1 | 28 | 48 |
| | | 1790 | මකර | 17 | 42 | 59 | | | 1866 | ධනු | 17 | 32 | 43 |
| සෝ | 1231 | 1791 | | | | | සෝ | 1307 | 1867 | | | | |
| අවස් | 1233 | 1793 | තුලා | 3 | 46 | 54 | අවස් | 1309 | 1869 | කටක | 3 | 36 | 38 |
| වි | 1236 | 1796 | මිථුන | 19 | 50 | 49 | වි | 1312 | 1872 | වෘශභ | 19 | 40 | 32 |
| | | 1798 | මීන | 5 | 54 | 44 | | | 1874 | කුම්භ | 5 | 44 | 28 |
| පව | 1239 | 1799 | | | | | පව | 1315 | 1875 | | | 48 | |
| | | 1800 | වෘශ්චි | 21 | 59 | 39 | | | 1877 | තුලා | 21 | | 23 |
| අවස් | 1242 | 1802 | | | | | අවස් | 1318 | 1878 | | | | |

ඡද්දන්තනාගරාජස්සාමි මහාධම්මරාජස්ස ජයවස්සෙතො පවවීසති මෙවස්ස ඛත්තිංසති අධික සත දසාධිමාස සුඛදිනෙ සාවනමාස කාලපක්ඛ සත්තමියං සීහලදීපතො ආගතානං වාලුතරමණ්ඩලික භික්ඛූනං ඤාණාභිවංස ධම්මසෙනාපති ථෙරෙන තියාදිනා මහා ධම්මරාජ වෙදවිනිච්ඡයකථා පරිනිට්ඨිතා.

බුරුමරට ව්‍යවහාර කලියුග වර්ෂ ගණනින් 1132 එක්දහස් එකසිය තිස්දෙකේදී ඡද්දන්තනාගරාජසාමි මහාධම්මරාජ නම් රාජශ්‍රීයට පැමිණ විසිපස්වෙනි වර්ෂයෙහිදී ලියනලද වේද විනිච්ඡයේ අටසිය දෙතිස් වන දසාධිමාස සුඛ දිනයවූ ශ්‍රාවණ මාස කෘෂ්ණපක්ෂ සත්වෙනි තිථිය ලත් දින සීහල දිවයිනෙන් පැමිණියාවූ වැලිතර තොටමුනෙ භික්ෂුන්ට ඤාණාභිවංසධම්ම සෙනාපති ස්ථවිරයන් විසින් භාරදෙනලද මහාධම්මරජුගේ වෙදවිනිච්ඡය කථාව නිමවනලදී යනු දක්වීමෙන් බුදුරජානන් වහන්සේ බිම්බිසාරරජතුමාගේ දූත්වීමට රජුන්ට අනුව පවතින්ට අනුදතිමියයි වදාළ අනුප්‍රඥප්තියට එකඟව අධික ගැර වස්විසු වර්ෂය පටන් සියලු අධි මාස වර්ෂ මණ්ඩලකොට වේදවිනිච්ඡයෙහි දක්වාතිබේ. ඒ පිළිවෙලින් ධම්මජෝති මහාස්ථවිරයන්වහන්සේද වර්ෂ එකසියතිසකට අධි මාස වර්ෂ ගණිතඥයෙක් ලවා ගන්නවාතිබේ. මෙසේ ඉර සඳ මෙන් ප්‍රකටව තිබෙන අධි මාස පිළිවෙල ඉක්මවා හිතුවක්කාරකම් කිරීම් බලවත් සාපරාධ ක්‍රියාවක් බව කාටනම් නොවැටහේද?

1 මෙසාදීනං වාදසන්නං රාසීනං රවිසඞ්කමා
වස්සං පමාණං කත්වාන සකවස්සම්පි ගණ්හති.

2 චන්දගතිවසාඑව තිථීනක්ඛත්තයොගතො
සෙම්මාසගිම්හවස්සාන වසෙන උතුගණ්හති.

3 සාසනස්සාපිතාසෙව උතූ තිසුවිසොධිය
ගහෙතුං පක්ඛමාසානි උග්ගහෙතුං නියාමිතං.

4 තෙසං තිණ්ණං උතූනන්තු මාසපුණ්ණෙන වාදස
සංවච්ඡරන්ති දීපෙසි දෙසනාසුවිසෙසතො.

5 නක්ඛත්තානං තිථීනංච විසමෙසි ගතීකිතු
චන්දස්සගම්භනං නිච්චං අධිකංචපවත්තති.

6 තස්මාවෙතීණි වස්සානි අතික්කම්මතොපරං
දීන මාසාධිකා හුත්වා මාසාතෙරසිකා භවෙ.

7 රාජානුවත්තනාපුබ්බෙ ආසාල්හිංහරිතුංමුනී
දෙසීතං අනුපඤ්ඤත්තිං සරනානයකොවිද.

8 වස්සානෙපන සම්පත්ත අධිමාසං යථාක්කමං
උග්ගණ්හෙනගිම්භන්තං උතුං සොධනතිවස්සිකං.

9 උතුපුබ්බහෙමන්ත ගිම්හෙසු අධිමාසකෙ
ආකඩ්ඪෙන්තගිම්හන්තං උතුංගණ්හන්ති වස්සිකං.
10 උක්කඩ්ඪනාකඩ්ඪනෙසු ලක්ඛණානි අපණ්ඩිතා
කිච්චන්තං අජානන්තා උක්කඩ්ඪුක්කඩ්ඪණං කරෙ.
11 යස්මිංබො පන වස්සම්හි අමාවාසීව තෙරසී
හොන්තීච අධිකං මාසං ගිම්හෙන්තමහරන්ති තෙ.
12 චිත්තයෙපිච ගණෙසු ආගතානි ඉමානිහි
ඨානානි අවිජානන්තා වස්සුක්කඩ්ඪණකංකරෙ.
13 පුණ්ණමීතෙරසී හොන්ති යස්මිං වස්සන්තතොපරං
වස්සෙ තෙරසිකා හොන්ති අමාවාසී නසංසයං.
14 තස්මිංයෙවහි වස්සම්හි ගිම්හානෙ තදනුපොසථෙ
කරණෙනෙව වස්සාන උතුනොවිසමංභවෙ.
15 පුණ්ණමීතෙරසීයුත්ත වස්සෙ ගිම්හ උතුම්හිතු
අධිකංහරන්තාය කරෙය්‍යදසුපොසථෙ
16 වාදසන්තානංහි මාසානං ලක්ඛණානි විජානිතුං
ආගමෙ චෙව වෙදඞ්ග ගණෙසුපිනිදස්සිතං.
17 චිත්තවෙසාඛ ජෙට්ඨාදි නක්ඛත්තානිතිවිරාධිය
ආසාල්හිමාසෙ ගිම්හාන උතුස්සන්තොගධොභවෙ.
18 තදාසාවන මාසොච ආසාල්හිකොත්තාසදූරා
වස්සුපනායිකාවත්තං පුරෙනාපි නපූරයෙ.
19 සචිත්තකා චිත්තකානි ආපත්තීනි බහූනිපි
උප්පජ්ජන්තිමහාවගග අනුපස්සන්තියා පන
20 සාසනස්සොපකාරාය හොන්තිවාපින හොන්තිවා
වීමංසන්තු විචාරෙන්තු සික්ඛාකාමා බහුස්සුතානි.

සූය්‍ර්යයාගේ ගමනින් මේෂාදි වාදසරාසීන්ගේ වර්ෂය ප්‍රමාණකොට ශකවර්ෂය ගණී. තිථි නක්ෂත්‍රයන්ගේ යෙදීම් වශයෙන් චන්ද්‍රයාගේ ගමන් වශයෙන්ම හෙමන්තය ගිම්හානය වස්සානය යන වශයෙන් ඍතුත්‍රය ගණී. ඒ ඍතු තුනම සාසන ව්‍යවහාරය වද පිරිසිදුකොටගන්ට පක්ෂමාසයන් උද්ග්‍රහණයකරන්ට නියම කරණලදය. ඒ ත්‍රිවිධ ඍතුන්ගේ මාස දොළසක් පිරීමෙන් සංවත්සරයයි දෙසනාවන්හි විශෙෂවශයෙන් දක්වූයේය. නක්ෂත්‍රයන්ගේද තිථින්ගේද විෂමවූ ගමන් හේතුකොටගෙණ චන්ද්‍රයාගේ ගමන නිරතුරුව අධිකව පවතී; එහෙයින් වර්ෂ දෙකකගේ තුන කගේ නොසික්මීමෙන් දින ගා මාසයක් අධිකව අන්‍යවූ මාස තෙලෙ[illegible] වර්ෂයක වර්ෂා ඍතුවෙහි ඇසලමස දෙකක්වූකල්හි පූර්ව ඇසළමස රජුන්ම


අනුව පැවතීමට හරින්ට බුදුරජාණන්වහන්සේ විසින් දේශනා කරනලද අනුප්‍රඥප්තිය සිහිකරන්නාවූ විනයක්‍රමයන්හි දක්ෂයෝ වර්ෂා ඍතුවෙහි පැමිණෙන අධිකමාසය යම්සේ ඒකීයනලද ආකාර ග්‍රීසම ඍතුවේ කෙළවරට ඇදගෙණ පොහොදසයක්කොට වස්සාන ඍතුව පූර්ණකොට ගණිත්, හේමන්ත ග්‍රීසමය යන ඍතු දෙක්හි ලැබෙන අධිමාසයන් එම ග්‍රීසමඍතුවේ කෙළවරට ඇද ගැණීමෙන් පොහො දසයක්කොට වස්සාන ඍතුව පූර්ණකොට ගනිති. අඥානයෝ උක්කඩ්ඪන ආකඩ්ඪන දෙක්හි විශෙෂ කිසි ලෙසමාත්‍රයකුදු නොදන්නාහු වස්සාන ඍතුවට පසුව ලැබෙන හෙමන්ත ග්‍රීෂ්ම දෙක්හි පෙණෙන අධිමාස ප්‍රථම ග්‍රීසම ඍතුවේ අගට ඇදගැන්මෙන් උක්කඩ්ඪනාකඩ්ඪනයකරත්. මෙහි විස්තරය වස්සාන ඍතුවෙන් පසු හෙමන්ත ග්‍රීසම ඍතු දෙකේ අධිමාස මැද පෙණෙන වස්සාන ඍතුවට මුලින් තිබෙන ග්‍රීසම ඍතුවේ අග පොහො දසයක්කොට අධිකයරින්නම් එය උක්කඩ්ඪකඩ්ඪනයයි. මෙය යාවාධිමාස මතග්‍රාහකයෝ කිසිසේත්නොදනිත්. යම් වර්ෂයක්හි අමාන්තාවධි තෙලෙසක්වෙත්ද ඒ අධිමාසය ග්‍රීෂ්මඍතුවගේ කෙළවරෙහිදී හැර වස්සාන ඍතුව පූර්ණකරගනිත්. විනයපාලියෙහිද වෙදාඞ්ගග්‍රන්ථයන්හිද පිරිසිදුව ආවාමූ උක්කඩ්ඪනාකඩ්ඪන යන මේ කාරණයන් නොදන්නෝ වරදව. වස්සූක්කඩ්ඪනයකෙරෙත්, යම් වර්ෂයෙක්හි පෞර්ණමී තෙලෙසක් වෙත්ද, ඉන්පසු වර්ෂයෙහි අමාන්තාවධි තෙලෙසක් යෙදෙත් සැකනැත්තේය, ඒ අධිමාසපතනයවූ වර්ෂයෙහි ග්‍රීෂ්ම ඍතුවේ පොහො දසයක් කිරීමෙන් වස්සාන ඍතුවගේ විසමයහරනේය. පෞර්ණමී තෙලෙසකින් යුක්තාවූ වර්ෂයක්හි අධිකහරනා පිණිස ග්‍රීෂ්මඍතුවෙහි පොහො දසයක් කෙරේද එයේ කාල කල්හි චාද්‍රමාසයන්ගේ ලක්ෂණ දැනගැන්මට ආගම ධර්මයෙහිද වෙදාඞ්ගග්‍රන්ථයන්හිද දක්වනලද සිත විසා දෙට ආදී නක්ෂත්‍ර වැරදී ඇසලමස ග්‍රීෂ්මඍතුවට ඇතුලත්වේ. එසේවූකලී නිකිණිමස ඇසල මසවේ, අන්‍ය ප්‍රකාරයකට නොවේ. වස්එලඹෙන වතපුරන්නේද නොපිරේ, සචිත්තකවූද අචිත්තකවූද බොහෝ ඇවැත් උපදිත්. මහාවග්ගපාළියෙහි දක්වනලද අනුප්‍රඥප්තියෙන් සංඝයාට උපකාරපිණිස වේදේහෝ නොවේද්දේහෝයි කියා ශික්ෂාකාමී බහුශ්‍රැතයෝ විමසත්වා. හීරණ ප්‍රඥාවෙන්විචාරණයකරත්වායිදක්පම්.

සද්ධම්මවංසික නිකායිකා සඞ්ඝනාථ
ථෙරෙන ධම්මතිලකෙන විවාදකානං,
යාවාධිමාස පරිවජ්ජිය සාසනත්ථං
~~වස්සාන ... අධිමාස පකාසිතානි.~~

# දැන්වීමයි.

බුරුමරට ව්‍යවහාර මණ්ඩල කලියුගවර්ෂ දශකාවයෙන් බෙදා ලැබෙන සෙසවලින් ඒ පඤ්චාදී අධිමාස සත දක්වාගැන්මට විනයාලඞ්කාරයෙහි දක්වාතිබෙන පිළිවෙල නොගෙන මෙරට ව්‍යවහාර කලියුගපාදයේ ගතාබ්ද සංඛ්‍යා මණ්ඩල කොට ලැබෙන සෙස වලින් අධිමාස වර්ෂ සටහන්කරගණ වරදවා අධිකහැර වස්විසීම කිරීමෙන් වාදභේදව එකිනෙකට විරුද්ධව පොත්පත් සැදීමෙන්. වර්ෂ විස්සකට අඩුනොවන කාලයක් ගතවිය. බුරුමමණ්ඩල ක්‍රමයට ලැබෙන අට්ඨාධිමාස වර්ෂයට ප්‍රථම වර්ෂයෙහි වාධිමාස වසයෙන්ද දශාධිමාස වර්ෂයෙහි පඤ්චාධිමාස වසයෙන්ද තෙරසාධිමාස වර්ෂයෙහි අට්ඨාධිමාස වසයෙන්ද සොළසාධි මාස වර්ෂයෙහි දශාධිමාස වසයෙන්ද අට්ඨාරසාධිමාස වර්ෂයෙහි තෙරසාධිමාස වසයෙන්ද චම්මාධි මාස වර්ෂයෙහි සොළසාධි මාස වසයෙන්ද පඤ්චාධිමාස වර්ෂයට පළමු වර්ෂයෙහි අට්ඨාරසාධිමාස වසයෙන්ද ගැණගෙණ විසුඤ්ජකකඩ්ඪනය කරත්, පෞණ්මිමාන්තාවධි දෙකකුත් මණ්ඩලවලට ඇතුලත්ව වරදවා අධික හැර තියිණි පසළොස්වකට වස්එළඹෙත් බුරුමරට ව්‍යවහාර කලියුග වර්ෂයේ එක්දාස්එකසියහතලිස්තුනේදී රාජ්‍යශ්‍රීයට පැමිණි ජද්දනනගජ රාජසාමි මහරජතුමා සංඝයාවහන්සේගේ ප්‍රාර්ථනයට ධර්ම වේදාඞ්ගපොත්වලින් කරුණු විමසාගෙණ සෑදූ වේදවිනිවජය නමැති පොතේ අවසානයෙහි බිම්සරමහරජතුමාගේ දැන්වීමෙන් සංඝයාවහන්සේලා විසුඤ්ජකකඩ්ඪනය කල වර්ෂය පටන් අධිමාස පතනය වන වර්ෂ එරට ව්‍යවහාර කලියුග වර්ෂ ගණනින් ගැණ පොතේ සටහන්කොට අධිමාස වර්ෂ අටසියතිස්දෙවෙනි දසාධිමාස සුඛ දිනයෙහි බෝගහපිටියේ ධම්මජොති මහාසථවිර පාදයන්වහන්සේට ඒ පොත දුන්බව කියාතිබේ, එපමනක්දනොව සිංහල්ලන් විසින් පාසාන ජිත්‍රයක් මෙන් මෙම පොත පිළිගෙණ දරන්වයයිද නියමකරතිබේ. මෙහි දක්වූ දශාධිමාසය යාවාධිමාස මතග්‍රාහිකයන්ගේ මණ්ඩලවල පඤ්චාධිමාසකොට ලියාතිබේ. වේදවිනිවජයෙහිපෙණෙනමණ්ඩලක්‍රමයට යාවාධිමාසකාරයින්ගේ මණ්ඩල පිළිවෙල හාත්පසින් ආකූලව්‍යාකූල බැව් කාට නම් නොවැටහේද, විසිවර්ෂයකට අඩුනොවන කාලයක් තුල යාවාධිමාසමතග්‍රාහිකයෝ සෑදූ පොත් වෛතුල්‍යවාදීන්ගේ පොත් හා සමානවීමද, යාවාධිමාස මතය ස්ථිරකිරීමට කල කී කථා බසුත් හිස් ප්‍රලාපවූබවද මේ පොතෙන් පෙණේ. සසරදුකට බියව වසන සුළු ප්‍රතිපත්තිකාමී ස්වාමීන්වහන්සේලා අපායභාගී වීමට හේතුවූ මේමිථ්‍යාවාද මතයෙන් බේරී ආත්මාර්ථපරාර්ථසිද්ධිය කරගැන්මට උත්සාහ කටයුතුයි.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු